සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# දෙවන වාර පරීක්ෂණය 2019

# නර්තනය

7 ශ්‍රේණිය

කාලය පැය 02 යි.

| නම/ විභාග අංකයඃ |
|---|

## I - කොටස

- **සියලුම ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුරු සපයන්න.**
- **අංක 01 - 05 දක්වා ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01 ගොඩ සරඹ අවසානයේ දී නටනු ලබන්නේ,

(1) හමාර පදය (2) ඉරට්ටිය (3) කස්තිරම (4) කලාසම

02 ''ළමා ලියෝ ගවසා මල් වරල පිට'' යනු

(1) තාලම් කවියකි. (2) කුළු කවියකි. (3) කළගෙඩි කවියකි. (4) ලී කෙළි කවියකි.

03 දඬු බෙරය යනු

(1) සෙලවීමෙන් හඬ නිපදවිය හැකි වාද්‍ය භාණ්ඩයකි.

(2) තට්ටු කිරීමෙන් හඬ නිපදවිය හැකි වාද්‍ය භාණ්ඩයකි.

(3) පිඹීමෙන් හඬ නිපදවිය හැකි වාද්‍ය භාණ්ඩයකි.

(4) තෙරපීමෙන් හඬ නිපදවිය හැකි වාද්‍ය භාණ්ඩයකි.

04 දොං ජිංත ගත දොංත යන බෙර පදය

(1) සුළු මැදුම් දෙතිතට අයත් ය. (2) සුළු මහ දෙතිතට අයත් ය.

(3) මැදුම් තනි තිතට අයත් ය. (4) මැදුම් මහ දෙතිතට අයත් ය.

05 දැල අඩිය යනුවෙන් හඳුන්වන්නේ,

(1) තුන්වන පා සරඹයයි. (2) හයවන පා සරඹයයි.

(3) පස්වන පා සරඹයයි. (4) පස්වන ගොඩ සරඹයයි.

- **ප්‍රශ්න අංක 06 - 10 දක්වා නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවන්න.**

(රත්නවල්ලි / නම්‍යතා අභ්‍යාස / ඇට්ටේරියා / අල්කුර්ආනය / ගොප් කොළ)

06 දවුල් කඩිප්පුව සෑදීම සඳහා ................................................................................ කෝටු භාවිතා කරයි.

07 කුළු නැටුම සඳහා ................................................................................ කවි යොදාගනී.

08 ඉස්ලාම් ආගමිකයන්ගේ ශුද්ධ වූ ග්‍රන්ථය ................................................................ නමින් හැඳින්වේ.

09 හත් අඩියේ භාවිත වන පියුම නිර්මාණය සඳහා ................................................................ යොදාගනී.

10 ශාරීරික ප්‍රසන්න බව සහ රසවින්දන හැකියාව සඳහා ................................................ ඉතා වැදගත් වේ.

- **ප්‍රශ්න අංක 11 - 15 දක්වා නිවැරදි පිළිතුර තෝරා යා කරන්න.**

| | | | |
|---|---|---|---|
| 11 | වෙස් නර්තනය | * | වන්නම් |
| 12 | අල්ලාහ් දෙවියන් | * | කුල්ල |
| 13 | අලංකාර මාත්‍රා | * | උඩරට |
| 14 | පූ කිරීම | * | දවුල |
| 15 | ඉල්ලම් මුදු | * | රාමසාන් උත්සවය |

- **ප්‍රශ්න අංක 16 - 20 පහත දැක්වෙන ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද වරහන් තුළ යොදන්න.**

16 උඩරට නර්තන සම්ප්‍රදායේ හිස වෙස් බැඳීමේ මංගල්‍යය ශීර්ෂාභරණ පැළඳවීමේ මංගල්‍ය යනුවෙන් හැඳින්වේ. ( )

17 උඩරට වන්නම් විනෝදාස්වාදය අරමුණුකොට නිර්මාණය වී ඇත. ( )

18 සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ සඳහා සම් වර්ග යොදාගනී. ( )

19 දවුල වාදනය සඳහා කඩිප්පුව යොදාගනී. ( )

20 නර්තන සම්ප්‍රදායන් තුනටම පොදු මූලික ඉරියව්ව මැණ්ඩිය නමින් හැඳින්වේ. ( )

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.**

01 ඔබ පන්ති කාමරයේ දී නිර්මාණය කරන ලද ගැමි නැටුම ඇසුරින් පහත සඳහන් ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

(i) ඔබ නිර්මාණය කරන ලද ගැමි නැටුම නම් කරන්න. (ල. 02)

(ii) ඒ සඳහා යොදාගත් කවියක් ලියන්න. (ල. 02)

(iii) එම නැටුම නිර්මාණයේ දී යොදාගත් රංග රටා 2 ක් අඳින්න. (ල. 02)

(iv) ජීවන වෘත්තියක් හා බැඳි ගැමි නැටුමක් නම් කරන්න. (ල. 02)

(v) ගැමි නැටුමක දැකිය හැකි ලක්ෂණ 2 ක් ලියන්න. (ල. 02)

02 ඉපැරණිම දේශීය වාද්‍ය භාණ්ඩය දවුල වේ.

(i) දවුල වාද්‍ය භාණ්ඩය ඇසුරින් පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

| සකස් කිරීමට ගන්නා දැව වර්ග | සකස් කිරීමට ගන්නා සම් වර්ග | වාදන අවස්ථා |
|---|---|---|
| 1. | 1. | 1. |
| 2. | 2. | 2. |

(ල. 2 x 3 = 06)

(ii) දවුල වාද්‍ය භාණ්ඩයෙහි රූප සටහනක් ඇඳ කොටස් 4 ක් නම් කරන්න. (ල. 04)

03 දේශීය නර්තන සම්ප්‍රදායන් තුනෙහිම ශිල්පීය ප්‍රාගුණ්‍යය එළිදක්වන අවස්ථා දක්නට ලැබේ.

(i) නර්තන සම්ප්‍රදායන් තුනෙහිම කලඑළි බැසීමේ අවස්ථා වෙන් වෙන්ව නම් කරන්න. (ල. 05)

(ii) උඩරට නර්තන සම්ප්‍රදායේ කලඑළි බැසීමේ අවස්ථාව පිළිබඳ හැඳින්වීමක් කරන්න. (ල. 05)

04 තනි තිතේ තාල රූප 2 ක් එකතුවීමෙන් දෙතිතේ තාල රූපයක් නිර්මාණය වේ.

(i) දෙතිතේ තාලරූප නම් කරන්න. (ල. 05)

(ii) ඉන් එක් තාලරූපයකට අයත් බෙර පදයක් ප්‍රස්තාර කරන්න. (ල. 05)

05 පහත සඳහන් මාතෘකා අතරින් 2 ක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

(i) ගොඩ සරඹ (ii) නම්‍යතා අභ්‍යාස

(iii) විකල්ප වාද්‍ය භාණ්ඩ (iv) ජන ගායනා (ල. 5 x 2 = 10)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01 | 3 | 06 | ඇට්ටේරියා | 11 | උඩරට | 16 | ✓ |
| 02 | 2 | 07 | රත්නවල්ලි | 12 | රාමසාන් උත්සවය | 17 | ✓ |
| 03 | 2 | 08 | අල්කුර්ආනය | 13 | වන්නම් | 18 | X |
| 04 | 1 | 09 | ගොප් කොළ | 14 | කුල්ල | 19 | ✓ |
| 05 | 3 | 10 | නම්‍යතා අභ්‍යාස | 15 | දවුල | 20 | ✓ |

(1 x 20 = 20)

## II කොටස

01 (i) කුළු හෝ තාලම් (ල. 02)

(ii) කුළු හෝ තාලම් කවියක් (ල. 02)

(iii) ගැලපෙන ඕනෑම රටාවකට ලකුණු දෙන්න. (ල. 02)

(iv) කුළු හෝ ගැළපෙන පිළිතුරකට ලකුණු දෙන්න. (ල. 02)

(v) එමකම, උපකරණ භාවිතය, සාමුහික බව, සරල බව, ගායනය සහිත වීම යනාදී.... ලක්ෂණ 2 ට (ල. 02)

02 (i)

| සකස් කිරීමට ගන්නා දව වර්ග | සකස් කිරීමට ගන්නා සම් වර්ග | වාදන අවස්ථා |
|---|---|---|
| 1. ඇහැළ | 1. එළු හම් | 1. හේවිසි වාදනය |
| 2. කොහොඹ, කොස්, මිල්ල, කිතුල් | 2. හරක් හම් | 2. පෙරහැර, සන්නිවේදනය සඳහා |

(එක් කොටසකට එක බැගින් ල. 06)

(ii) රූප සටහන ඇඳ කොටස් 4 ක් නම් කර ඇත්නම් (ල. 04)

03 (i) උඩරට සම්ප්‍රදාය - හිස වෙස් බැඳීමේ මංගල්‍යය (ශීර්ෂාභරණ පැළඳවීමේ මංගල්‍යය)

පහතරට සම්ප්‍රදාය - මඩු බැසීමේ මංගල්‍යය

සබරගමු සම්ප්‍රදාය - ගුරුවරම් දීමේ මංගල්‍යය (ල. 05)

(ii)
* ජන්ම පත්‍රයට අනුව දිනය නියම කර ගැනීම.
* තෙමසකට කලින් සිට කිලිවලින් ආරක්ෂා වීම.
* එම කාලය තුළ ගුරුවරයාගෙන් ශිල්ප ඉගෙනීම.
* නැකැත් දිනට ආසන්න දින 7 ක් විහාරස්ථානයේ ආගමික වතාවත්වල යෙදීම.
* නැකැත් දිනට ප්‍රථම දින හඟල ප්‍රධානව රංග වස්ත්‍රාභරණ පේ කිරීම
* බෝධි පූජාව
* නැකැත් දින උදෑසන සෙත්පිරිත් මැද හිසවෙස් තැබීම.
* සුදු රෙදි කඩකින් ආවරණය කර විහාරගෙයින් පිටතට පැමිණ අදාළ චාරිත්‍ර සිදුකිරීම.
* බෝ රුක හෝ මල් බුලත් තටුව හෝ දෙස බලා වහන්තරාව ඉවත් කිරීම.
* පළතුරු පූජාවක් පිළිගන්වා ගුරු පා නමැද මංගලම් නර්තනයෙන් රංගනය ආරම්භ කිරීම යනාදී වැදගත් කරුණු සඳහා ලකුණු ලබාදෙන්න. (ල. 05)

04 (i) සුළු මැදුම් දෙතිත, සුළු මහ දෙතිත, මැදුම් මහ දෙතිත (ල. 05)

(ii)

| 1́ | 2 | 1́ | 2 | 3 | 1́ | 2 | 1́ | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|---|---|
| දොං | - | ජිං | - | ත | ග | ත | දොං | - | ත |

(ල. 05)

05 මාතෘකාවට අදාළව වැදගත් කරුණු සඳහා ලකුණු ලබාදෙන්න. (ල. $5 \times 2 = 10$)

*සියලුම හිමිකම් ඇවිරිණි*
*All Rights Reserved*

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# දෙවන වාර පරීක්ෂණය 2019

**7 ශ්‍රේණිය**

# නර්තනය

## ප්‍රායෝගික පරීක්ෂණය

| | | | |
|---|---|---|---|
| 01 | (i) | කැමති ගායනය | (ලකුණු 05) |
| | (ii) | ගුරුවරයා විසින් නම්කරන ලද ගායනය | (ලකුණු 05) |
| 02 | (i) | 3 - 5 දක්වා ගොඩ සරඹයක් (ගුරුවරයාගේ අභිමතය පරිදි) | (ලකුණු 05) |
| | (ii) | සරඹයට අදාළ කස්තිරම | (ලකුණු 05) |
| 03 | තුරඟා වන්නමට අදාළ අලංකාර මාත්‍රයක් | | (ලකුණු 10) |
| 04 | කුළු හෝ තාලම් ගැමි නැටුම් දෙකෙන් එකක් | | (ලකුණු 10) |
| 05 | කැමති චරිතයක් නිර්මාණය | | (ලකුණු 10) |

(මුළු ලකුණු 10 x 5 = 50)